BOI
SRI LANKA

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### *ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් මසා දීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම - 2024 වර්ෂය (BOI/S&S/Q/43/2024)*

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් මසා දීම වෙනුවෙන් පළපුරුද්ද ඇති පිළිගත් සේවා සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

සේවා සැපයුම්කරුගේ සේවා පළපුරුද්ද අවම වශයෙන් වසර තුනකි. මිල ගණන් පත්‍රිකා මුදල් අයකිරීමකින් තොරව පරීක්ෂා කිරීමට හැකිවන අතර ප්‍රසම්පාදනයට අදාල සියලුම උපදෙස් හා කොන්දේසි සේවා සැපයුම්කරුවන් විසින් නිසියාකාරව කියවා බලා දැනුවත් වී මිල ගණන් ඉදිරිපත් කරන මෙන් දැනුම් දෙමු.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛන පරීක්ෂා කිරීමේ විස්තර සහ වැඩිදුර විස්තර දැනගැනීම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) (දු.ක 011- 2543041 / 074-1531432) ,ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 9 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 වෙතින් සිදුකල හැක.

**2024 අප්‍රේල් 29** දින දක්වා රාජකාරි දිනවල පෙ.ව. 9:00 සිට ප.ව. 3:00 දක්වා රු. 3000/- (SSCL සහිතව ) + 18% (VAT) ක නැවත නොගෙවන ගාස්තුවක් ගෙවා ඉහත ලිපිනයේ පිහිටි පරිපාලන දෙපාර්තමේන්තුවේ සැපයුම් අංශය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමේ ලේඛනය ලබාගත හැක.

මෙම ප්‍රසම්පාදනයට අදාල පූර්ව ලංසු රැස්වීම (Pre-Bid Meeting) **2024 අප්‍රේල් 04** වන දින ප.ව. 02:00 ට පරිපාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි දී පැවැත්වීමට නියමිතය

මුද්‍රා තබන ලද මිල ගණන් සමඟ රු. 10,000/- ක ආපසු ගෙවනු ලබන මුදල්/බැංකු ඇපකරයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ තැන්පත්/ ඉදිරිපත් කළ යුතුය.

මුද්‍රා තබන ලද සියලු විස්තර ඇතුළත් මිල ගණන් **2024 අප්‍රේල් 30** දින ප.ව. 2:30 ට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව I, අධ්‍යක්ෂ (පරිපාලන) බාරේ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 09 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ඉහත ලිපිනයේ පිහිටි සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට කටයුතු කළයුතුය. එදිනම ප.ව. 2:30 ට මිල ගණන් විවෘත කරනු ලබන අතර එම දින නියමිත වේලාවෙන් පසුව ලැබෙන මිල ගණන් පත්‍ර විවෘත කිරීමෙන් තොරව සේවාසැපයුම්කරුට ලැබීමට සලස්වනු ලැබේ.

මිල ගණන් ඉදිරිපත් කරන අයට හෝ බලයලත් නියෝජිතයෙකුට හෝ එම අවස්ථාවට සහභාගිවිය හැකිය.

මිල ගණන් බහා එවන ලියුම් කවරයෙහි ඉහළ වම් කෙලවර "**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් මසා දීම- 2024 *වර්ෂය*** "යනුවෙන් සඳහන් කළයුතුය.

කොන්ත්‍රාත්තුව සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.